# බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

*ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191 ක් ගත වී ඇති මේ මොහොතේ 19 වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. අප මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 1892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.*




ශ්‍රියා කුමාරසිංහ නවසීලන්තයේ සිට

## තල්, පොල් සහ මුතු පබා

8 වැනි කොටස

# ඇලන් වෝල්ටර්ස් දුටු නගර සිරි

කොළඹ හෝටලයේ දොරටුව වෙත අප පා නගනවාත් සමගම රික්ෂෝ කරුවන් විශාල පිරිසක් අපගේ අනුග්‍රහය ඉල්ලා කෑකෝ ගසමින් උපරිම වේගයෙන් අප වෙත දිව ආවෝය. උදය කාලය පුරා හැකි තාක් වේලා නගර සිරි නරඹමියි සිතා ඉන් එකක නැගී පිටත් වුනෙමි. පළමු කොටම ස්වදේශිකයින් වාසය කරන පිට කොටුව නැතහොත් කළු නගරය වෙත යනු වස් දර්ශනීය කොම්පඤ්ඤවීදිය පසු කලෙමි. එම නම ලැබුණ ආකාරය පිලිබඳව මෙවන් කතාවක් ඇත. 1844ට පෙර පැරණි වහල් යුගයේදී කොටුවේ එක්තරා නිවසක විසූ කාපිරි වහලුන් පිරිසක් නිවැසියන් විසින් ඔවුන්ට දෙනු ලැබූ කෲර වද හිංසා ඉවසනු නොහැකිව මුළු පවුලම ඝාතනය කර ඇත. එතැන් පටන් සෑම සැන්දෑවකම වහලුන් සියළුදෙනාම ඔරුවල නංවා එවකට දූපතක්ව තිබූ මෙම ප්‍රදේශයට ගෙනැවිත් දමා රෑ එළිවන තුරු රෑ කවල් පිට තැබුවේලු.



කොළඹ නොරිස් වීදිය - බ්‍රිතාන්‍ය පාලන සමය

මෙහි අලංකාර පොල් රුප්පාවලින් සහ ගෙවතු වලින් වටවූ සෑහෙන තරමට විශාල සුන්දර කලපුවක් තිබේ. සැඳෑ හිරු බැස ගෙන යන යාමයේ මේ වැවේ බෝට්ටු පැදීමද කොළඹ ජීවිතයේ එක් ප්‍රසන්න අත් දැකීමකි. මෙතැන් සිට තරමක් ඈතට යන විට ජනාකීර්ණ පිට කොටුව නගරයයි. එය එක් පසෙකින් වරාය දක්වා පැතිරී, සැතපුමක් දෙකක් රවුමට විහිදී කැළණි ගංතොට තෙක් ඇදී නතර වේ. මුල් කාලයේ කලන්බුව හෝ කලන්බු ආදී වශයෙන් කැළණි ගඟ ආශ්‍රිත නමකින් කොළඹ නගරය හඳුන්වා ඇති අතර පසු කාලයේදී මා මෙයට පෙරද පැවසූ පරිදි පෘතුගීසීන් විසින් සිය ශ්‍රේෂ්ඨ නැව්යා සිහිපත් කරනු වස් එවකට පැවති නම වෙනස් කරනු ලැබ ඇත.

පළමු වරට පිට කොටුව හරහා යන ගමන ඉංග්‍රීසි ජාතිකයෙකුට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉමහත් විනෝදයක් ගෙන දෙන්නකි. ශුද්ධ වූ ආගමික දිනයකදී ඒකරාශි වන ජන ප්‍රමාණයට වඩා කිහිප ගුණයකින් වැඩි ජනකායක් මීමැසි පොදිය මෙන් පොදි ගැසේ. හිස් වැසුම් පැළඳි මුස්ලිම් මිනිසුන්, සාමාන්‍ය තොප්පි පැළඳි අය, තලප්පා බැඳි අය, රෙදි බැනියම් ඇඳි අය, කලිසම් ඇඳි අය, සපත්තු පැළඳි අය, ඉහලට නමා වැටුණු කොන් සහිත කහ හෝ රතු පැහැති සෙරෙප්පු පැළඳි අය, දැවෙන හිරු රැස් විනා අන් කිසිවක් නොපැළඳි අය ආදී වශයෙන් නානා විධ මිනිසුන්ය. මහ පොලව මත මේසා නානා විධ මනුෂ්‍ය කොට්ඨාශයන් එකට මිශ වී සිටින ස්ථාන ඇත්නම් ඒ ඉතා ස්වල්පයකි. මෙසේ ඒකරාශි වී සිටින අයගෙන් බොහෝ දෙනා කරන කාරියක් නම් නැත. එක්කෝ මැක්කන් තලති. නැතහොත් අසල්වැසියන් සමග ඔහේ ඔපාදූප දොඩමින් සිටිති. සුළු පිරිසක් පමණක් හෙමින් සීරුවේ නිහඬව එළිමහන් වෙළඳ පොලේ හෝ කුඩා කඩ මැස්සේ හෝ සාප්පුවේ සිය රාජකාරිය කරති. වීදියක හරි අඩක පමණ දුරක් අතරතුර සිංහල, දෙමළ, අරාබි, මැලේ, කලවම් ජාතීන් සහ කුමන කණ්ඩායමකට අයත් දැයි තෝරා බේරා ගත නොහැකි මිනිසුන් බොහෝ මුණ ගැසෙති. තරමක් ඈතින් සාමණේර නමක් හෝ ඉහල තරාතිරමක ස්වාමීන් වහන්සේ නමක් විශාල තඹ පාත්‍රයකට පිඬු සිඟා වඩිනු පෙනේ. නුදුරින් ඇබිත්තයා නැතහොත් සුදු පිළි හැඳගත් පිරිමි ළමයෙකු විසින් ඔසවා ගෙන එන කුඩයක් යටින් හෙමිහිට පියවර මනින දීප්තිමත් කහ පැහැති සිවුරක් පොරවා ගත් සහමුලින්ම හිස මුඩු කළ හාමුදුරු නමකි. ඒ ආසන්නයේම ගෝනි මලු වැනි විශාල කලිසම් සහ කොල පැහැති සිනිඳු සේදයෙන් කල උඩ කබායක් හැඳි මහමදික පූජකවරයෙකි. සමහර විටෙක අපට මෙහිදී ආදි ගෝත්‍රිකයින්ගෙන් පැවත එන, මුහුණ වසාගත් වැද්දෙකු ද මුණ ගැසීමට ඉඩ තිබේ. ඉතා ශීඝ්‍රයෙන් අඩු වී ගෙන යන මනුෂ්‍ය කොට්ඨාශයක් වන වැද්දන් නගරයේදී දක්නට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. ඉඳහිට නගරයේ ගැවසෙන ජනකාය අතර අතනින් මෙතනින් උස කහ පැහැති තලප්පාවක් පැළඳි උඩුකුරුව කරකැවූ රැවුලක් හා කළු හිසකෙස් ඇති, කහ දුඹුරු සුසංයෝ ජනයෙන් සෙමිටික්වරුන් හා සමාන, ශක්තිමත් උස සිරුරින් යුතු මරක්කල මිනිසුන් දැකිය හැකිය.

*කොළඹ වෙසෙන සියල්ලෝම එක් රැස් වන උද්‍යානය බඳු පිට කොටුවේ අමුත්තන්ට කුතුහලය දනවන බොහෝ දෑ විකිණීමට තිබේ. අඩියක් පමණ දිග අන්නාසි ගෙඩියක් පැන්සයකි.*

මුලින්ම අපේ අවධානය යොමු වූ කරුණක් නම් ජනගහණයෙන් දහයෙන් නව දෙනෙක්ම දරුණු ලෙස ලේ වමනය කරන බවයි. නමුත් ඒ හා සැනෙකින්ම ඔවුන්ගේ තොල් වල සග දත් වල ඇති ලේ ගලන පැල්ලම් ඒ හැම කෙනෙකුටම පොදු බුලත් කෑමේ සිරිත නිසා ඇති වුවක් බව අපි සොයා ගතිමු. සෑම කෙනෙකුම පාහේ හිසේ බැඳි තලප්පාවේ හෝ සරම යනුවෙන් හඳුන්වන ඉන වටා එතූ රතු රෙදිකඩේ දවටා හැඹිලියක් ගෙන යති. එම කුඩා පසුම්බිය ඇර බැලුවහොත් එතුල පුවක්, බුලත් (පනමකට කොල හතරකි. දැඩි සුවඳකින් හා කට දන ගතියකින් යුතුය.) දුම්කොල (ගං මෝය අසබඩ දියළු බිම්වල වැවේ.) ඉඟුරු, කුඩා කතුරක්, සහ මුතු බෙලි කටු පෝරණුවක දමා පුළුස්සා සාදා ගනු ලබන හුණු දැමූ කුඩා පෙට්ටියක් දැකිය හැකිය. කුඩා කඩල ඇටයක් තරම් වන හුණු ටිකක්, පුවක් කැබලි අහුරක්, කුඩා ඉඟුරු කැබැල්ලක්, දුම් කොල ස්වල්පයකුත් දමා එකට කලවම් කර ගත් විට ඉතා ප්‍රනීතය. මේ සියල්ලම එකතු කොට බුලත් කොලයක දවටා පැය ගණන් හපති. පුවක් වලින් දීප්තිමත් රතු පැහැයක් ගෙන දෙන අතර එය මත්ද්‍රව්‍යයකටද වඩා සැර උත්තේජකයකි. දවන සුළු හුණු හැපීම හේතු කොට ගෙන ස්වදේශිකයින් බොහෝ දෙනා මුව පිළිකා වලින් වේදනා විඳිති. මෙසේ මග ගෙවද්දී වරින් වර අප පසු කර යන මොල්ලි ගොනුන් විසින් ඇද ගෙන යනු ලබන පොල් අතු වලින් මුදුන ආවරණය කල කරත්ත වලින් නැගෙන කරකර හඬින් අපේ කන් කීරී ගැසී යයි. අශ්වයින් නම් කීප දෙනෙකුම දැක ගන්නට හැකි වුවද බූරුවන් නම් එකෙකු හෝ නොදුටුවෙමු. පෙනුමෙන් හිවලෙකුගෙන් අඩකට වඩා තරමක් විශාල බල්ලෝ ඒ අවට අධික ලෙස ගැවසුණාහ. එමෙන්ම මාළු අහින් මෙන් පොදිකන කුඩා කළු ඌරු පැටවුන්ද, දුක්ඛිත පෙනුමෙන් යුත් කුකුල්ලුද ඉඳහිට තැනකදී දිග කකුල් සහිත එළුවන්ද දක්නට ලැබුණි. අප වෙළඳ පොලට ඇතුළු වන විටම සුදු ජැකට්ටුවකින් හා රතු තලප්පාවකින් සැරසුණ දෙමළ මිනිසෙකු විසින් දක්කා ගෙන ආ කඩිසර බුරුම ගවයින් දෙදෙනෙකු බැඳි කුඩා බක්කි කරත්තයේ නොහැපී බේරුණේ අනු නවයෙනි. නගරයේ එවැනි බක්කි කරත්ත ඔනෑ තරම් කුලියට ගැනීමට තිබේ. කරත්තය ඔබටම දක්කා ගෙන යාමට අවශ්‍ය නම් එසේ කල හැකිය. බක්කි

*නගරයේ එවැනි බක්කි කරත්ත ඔනෑ තරම් කුලියට ගැනීමට තිබේ. කරත්තය ඔබටම දක්කා ගෙන යාමට අවශ්‍ය නම් එසේ කල හැකිය.*

24 වන පිටට

## කවි කොළය

නැකතට බුලත් දී කැන්දාගෙන ආපු
නැහැ ඇස් වහක් ලස්සන අලි මනමාලී
එකගෙයි සහෝදරවරු කළ අරියාදූ
අහලා මෙහෙම කිව්වලු කට කහනවට

අලි කොටි හවුල පිළිබඳ බෙරිහන් දීලා
රතු මනමාලි කෙරුවේ මොන බම්බුවද?
සාමයෙ බිළිඳු කුමරුට අම්මා වෙන්න
බැහැ කෑ ගැහැව්වට බොරු විළි රුදාවට

වෙත්තසිංහ